සියලුම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

# 43 - ක්‍රිස්තියානි ධර්මය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ............................................
............................................ √ △ $\frac{4}{5}$
............................................

(ii) ............................................
............................................ √ △ $\frac{3}{5}$
............................................

(iii) ............................................
............................................ √ △ $\frac{3}{5}$
............................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

## ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

## ලකුණු ලැයිස්තු සකස් කිරීම :

මෙවර සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ ඇතුළත් කර අකුරෙන් ද ලියන්න. අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

## එක් එක් ප්‍රශ්න පත්‍රයේ ලකුණු බෙදී යාමේ සාරාංශය

01. ක්‍රිස්තියානි ධර්මය I ප්‍රශ්න පත්‍රය (කාලය පැය 02 කි)

බහුවරණ ප්‍රශ්න 50 කි.

එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් (2 x 50) ලකුණු 100 කි.

02. ක්‍රිස්තියානි ධර්මය II ප්‍රශ්න පත්‍රය (කාලය පැය 03 කි)

මෙය I කොටස සහ II කොටස වශයෙන් කොටස් දෙකකි.

**I කොටසට ප්‍රශ්න 03 කි**

- ප්‍රශ්න 02 කට පමණක් පිළිතුරු අපේක්ෂා කෙරේ.
- එක් ප්‍රශ්නයකට අනු කොටස් 05 කි.
- එක් අනු කොටසකට ලකුණු 04 බැගින් අනු කොටස් 05 ට ලකුණු 20 කි.
- ප්‍රශ්න 02 ටම (2 x 20) ලකුණු 40 කි.

**II කොටසට ප්‍රශ්න 05 කි**

- ප්‍රශ්න 03 කට පමණක් පිළිතුරු අපේක්ෂා කෙරේ.
- එක් ප්‍රශ්නයකට (i) සහ (ii) වශයෙන් කොටස් දෙකකි.
- (i) කොටසට ලකුණු 10 ක් ද,
- (ii) කොටසට ලකුණු 10 ක් ද, වශයෙන් එක් ප්‍රශ්නයකට ලකුණු 20 කි.
- ප්‍රශ්න තුනටම (3 x 20) ලකුණු 60 කි.

03. I පත්‍රය ලකුණු - 100

II පත්‍රය ලකුණු - 100

200

මුළු ලකුණු - 200 ÷ 2 = 100

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ந்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

ක්‍රිස්තියානි ධර්මය I
கிறிஸ்தவம் I
Christianity I

43 S I

2018.08.06 / 0830 - 1030

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** පුරාණ ගිවිසුමෙහි ග්‍රීක පරිවර්තනය හඳුන්වන නාමය වනුයේ,
(1) සෙප්ටුවාජින්ත ය. (2) බිබ්ලිඔන් ය. (3) වල්ගේට් ය.
(4) මැසොරෙටික් ය. (5) කුම්රාන් ය.

**2.** ඊශ්‍රායෙල් ඉතිහාසය තුළ අනාවරණය වූ දේව ක්‍රියාකාරිත්වය ක්‍රිස්තුන් වහන්සේ තුළින් පූර්ණත්වයට පත් වූ අයුරු සඳහන් ලිපිය කුමක් ද?
(1) හෙබ්‍රෙව් (2) 1 තිමෝති (3) 1 කොරෙන්ති
(4) 2 තිමෝති (5) 2 කොරෙන්ති

**3.** ශුද්ධ බයිබලය තුළ දේවානුභාවය ලද ලේඛකයා ලියූ දේ තුළින් දේව අනාවරණය ලබන්නේ,
(1) දේව ජනතාව ය. (2) කිතුනු විශ්වාසකයින් ය.
(3) බයිබල් විශාරදයින් ය. (4) එය කියවන පාඨකයන් ය.
(5) එය අධ්‍යයනය කරන්නන් ය.

**4.** ජේසුන් වහන්සේගේ ජීවිතය හා වඩාත් බැඳී පැවති ප්‍රදේශය වූ ගලීලයේ උතුරු මායිම වන්නේ,
(1) කාර්මෙල් කඳුවැටියයි. (2) ලෙබනන් කඳුවැටියයි.
(3) එසඩ්‍රේලොන් තැනිතලාවයි. (4) කපර්නාවුමයි.
(5) සීනයි අර්ධද්වීපයයි.

**5.** ග්‍රීක අධිරාජ්‍ය සමයේ පලස්තීනය තුළ ජුදා ආගම කෙලෙසන පිණිස මිසදිටු වැඳුම් පිදුම් ජුදෙව්වන්ට බලෙන් පිළිගැන්වීමට උත්සාහ කළේ කවරෙකු ද?
(1) මහා ඇලෙක්සැන්ඩර් (2) පොම්පේ රජතුමා
(3) අන්තියෝකස් එපිපානිස් (4) මහා හෙරෝද්
(5) මඩ්රි

**6.** පංච පුස්තකය තුළ අඩංගු සම්ප්‍රදාය හතරෙහි ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
A - අන් මැවිලි කෙරෙහි ආධිපත්‍යය මිනිසාට ලබාදීම
B - දේශන සහ අනුශාසනා විලාසයෙන් ලියවී ඇත.
C - වන්දි ගෙවීමෙන් පව් කමාව ලැබේ.
D - වඩාත් කලාත්මක උසස් හෙබ්‍රෙව් භාෂාව අන්තර්ගතවීම
E - ක්‍රි.පූ. 587 න් පසුව ඇරඹිණි.
මේවා අතරින් පූජක සම්ප්‍රදායට අයත් ලක්ෂණ අඩංගු වරණය කුමක් ද?
(1) A, B හා C (2) B, C හා D (3) A, D හා E (4) A, C හා E (5) B, D හා E

**7.** ශුද්ධ ලියවිලි විශාරදයින්ට අනුව පංච පුස්තකය රචනය කෙරෙහි පදනම් වී ඇත්තේ,
(1) මෝසෙස්තුමාගේ ඉගැන්වීම් ය.
(2) සීනායි ගිවිසුම ය.
(3) නික්මයාම ගමනේ ලද විමුක්තියේ අත්දැකීම් ය.
(4) ආදිපිතෘවරුන්ගේ කාලයේ වූ යම් යම් සිදුවීම් ය.
(5) ප්‍රාග් ඓතිහාසික යුගයේ සිදුවීම් ය.

**8.** බයිබල් විශාරදයින් පෙන්වා දෙන පරිදි පීඩා දහයේ කතා සඳහා පසුබිම් වී ඇත්තේ මොනවා ද?
(1) නික්මයාම ගමනේ අත්දැකීම්
(2) මෝසෙස් විසින් ලියන ලද සමහර සිදුවීම්
(3) පංච පුස්තක රචකයාගේ අත්දැකීම්
(4) ජුදා පාස්කුව සම්බන්ධව ලියවී ඇති කරුණු
(5) අතීතයේ සමහර ඓතිහාසික විපත්තිමය සිදුවීම්

**9.** සමිඳාණන් වහන්සේ මෝසෙස් සහ ආරොන් එවන ලද බවට පාරාවෝ ඉදිරියෙහි සාක්ෂියක් ලෙස සිදු වූ සිදුවීමක් වන්නේ,
(1) කරදිය උල්පතකින් ජලය ලබාදීමයි. (2) කුළුඳුලන්ගේ මරණයයි. (3) රතු මුහුද තරණයයි.
(4) සැරයටිය සර්පයකු වීමයි. (5) ජලය රුධිරය වීමයි.

**10.** දිවැසිවර කැඳවීම්වලට අනුව යෙසායා දිවැසිවරයාගේ කැඳවීම තුළ 'යවනු ලැබීම' සිදු වූයේ කෙසේ ද?
(1) සියල්ල ඔවුන්ට පවසන්න යනුවෙනි.
(2) සෙනඟට දූත් පණිවුඩය මගිනි.
(3) කැරලිකාර වංශය වෙත මම ඔබ යවමි යනුවෙනි.
(4) විප්‍රවාසී සෙනඟ වෙත යන්න යනුවෙනි.
(5) මාගේ සෙනඟ වෙත යන්න යනුවෙනි.

**11.** මෙසියස්තුමාගේ පැමිණීම සමඟ ක්‍රි.පූ. 922 දී දෙකඩ වූ ඊශ්‍රායෙල් රාජ්‍යය නැවත ඒකීය රාජ්‍යයක් වන බව දැක් වූ දිවැසිවරයා කවුද?
(1) යෙසායා (2) සෙකරියා (3) හොසියා (4) මීකා (5) ආමොස්

**12.** මෙසියස්වරයා කෙබඳු ද යන්න යෙසායාගේ පොතේ ගීත කිහිපයකින් දැක්වේ. මේවායින්, උපතට පෙර සිටම සමිඳාණන් වහන්සේ දුක් විඳින සේවකයාව කැඳවා ඇති බව කියැවෙන්නේ කුමන ගීතයෙන් ද?
(1) පළමුවන ගීතය (2) දෙවන ගීතය (3) තෙවන ගීතය
(4) සිව්වන ගීතය (5) පස්වැනි ගීතය

**13.** යෙසායා 5:1-7 දක්වා කොටසෙහි සඳහන් 'මිදිවත්ත පිළිබඳ ගීය'ට අනුව මිදිවත්ත, මිදි වැල් සහ පෙම්වතා මගින් සංකේතවත් වන්නේ පිළිවෙළින්,
(1) ජුදා සෙනඟ, ඊශ්‍රායෙල් වංශය සහ දෙවියන් වහන්සේ ය.
(2) ඊශ්‍රායෙල් වංශය, ජුදා සෙනඟ සහ දෙවියන් වහන්සේ ය.
(3) ලෝක වාසීන්, ඊශ්‍රායෙල් වංශය සහ දෙවියන් වහන්සේ ය.
(4) ඊශ්‍රායෙල් වංශය, ජුදා සෙනඟ සහ ක්‍රිස්තුන් වහන්සේ ය.
(5) ලෝක වාසීන්, තෝරාගත් ජනතාව සහ ක්‍රිස්තුන් වහන්සේ ය.

**14.** ජෙරුසලමේ දේව මාලිගය ගොඩනැංවීමට පෙර ජුදා ජනතාව ගිවිසුම් කරඬුව ආශ්‍රිත ජනවන්දනාත්මක චාරිත්‍ර වාරිත්‍ර සිදු කරනු ලැබුයේ,
(1) සිනගෝගයේ දී ය. (2) සීනායි කන්ද පාමුල දී ය. (3) කූඩාරමක දී ය.
(4) ධර්මශාලාවල දී ය. (5) බෙයර්ෂෙබාහි විශේෂ පූජාසනයක දී ය.

**15.** ශුද්ධ වූ මාක්තුමා තම සුභාරංචිය රචනා කිරීම සඳහා කරුණු ලබා ගෙන ඇති ප්‍රධානතම මූලාශ්‍රය කුමක් ද?
(1) ශුද්ධ වූ පාවුලුතුමාගේ දේශනා හා ඉගැන්වීම්
(2) ශුද්ධ වූ පේදුරුතුමාගේ දේශනා හා ඉගැන්වීම්
(3) රෝමයෙන් ලබා ගත් කරුණු
(4) ප්‍රාතිහාර්ය පිළිබඳ ලියැවුණු ලිපි
(5) ශුද්ධ වූ මාක්තුමාගේ ක්‍රිස්තියානි සමූහයේ අත්දැකීම්

**16.** ශුද්ධ වූ මතෙව් සුභාරංචිය තුළ දක්නට ලැබෙන වගන්තිවලින් එතුමාට පමණක් ආවේණික වගන්ති ගණන සියයට,
(1) 10 කි. (2) 20 කි. (3) 30 කි. (4) 40 කි. (5) 50 කි.

**17.** සමදර්ශක සුභාරංචිවල කතෘත්වය සහ රචනා වූ කාලය පිළිබඳව ඉදිරිපත් වී ඇති නිගමනයක් වන 'ද්විලේඛන සම්ප්‍රදාය' 1833 දී ඉදිරිපත් කරනු ලැබුවේ,
(1) ජේ. හුවයිස් විසිනි. (2) වෙල්හවුසන් විසිනි.
(3) විල්හෙල්ම් වීඩ් විසිනි. (4) එච්.ජේ. හොල්ස්මන් විසිනි.
(5) බුල්ට්මාන් විසිනි.

**18.** දේව රාජ්‍යය 'සලකුණක්' බව සඳහන් කරන උපමාව වන්නේ,
(1) නිධානය පිළිබඳ උපමාව ය. (2) මුතු ඇටය පිළිබඳ උපමාව ය.
(3) දැළ පිළිබඳ උපමාව ය. (4) අබ ඇටය පිළිබඳ උපමාව ය.
(5) කිරිඳි සහ කිරිඟු පිළිබඳ උපමාව ය.

**19.** අංශභාග රෝගියා සුව කිරීමේ ප්‍රාතිහාර්යයේදී දෙවියන් වහන්සේ ශාරීරික සුවය මෙන්ම ආධ්‍යාත්මික සුවය දානය කරන බව ක්‍රිස්තුන් වහන්සේ ප්‍රකාශ කරන ලද්දේ කා හට ද?
(1) විනයධරයන්ට (2) පරිසිවරුන්ට
(3) අංශභාග රෝගියාගේ නෑදැයින්ට (4) අනුන්ගෙන් යැපෙන්නන්ට
(5) එහි සිටි සියලු දෙනාට

**20.** පළමුවන ශියවසේ අග භාගයේදී ශුද්ධ වූ සභාවට මුහුණදීමට සිදු වූ ප්‍රශ්න දෙකකි. ඒවායින් එකක් වන්නේ,
(1) ක්‍රිස්තියානි යුගාන්ත ධර්මයයි.
(2) ඒරියන් වාදයයි.
(3) මළවුන් නැවත නැගිටීම පිළිබඳ විශ්වාස නොකිරීමයි.
(4) ශුද්ධ වූ සභාව ජුදෙව් දහමේ ශාඛාවක් ලෙස පිළිගැනීමයි.
(5) අපෝස්තුළුවරුන්ගේ ප්‍රාණ පරිත්‍යාගයයි.

**21.** ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම හා මරණය තුළ අන්තර්ගත ප්‍රධාන සිදුවීම් තුළින් ම ශුද්ධ වූ මාක්තුමා ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳව ප්‍රකාශ කරන ප්‍රධාන කරුණ වන්නේ, උන්වහන්සේ
(1) මෙසියස් බව ය. (2) වීරයකු බව ය. (3) දේව පුත්‍රයා බව ය.
(4) නිර්දෝෂී පුද්ගලයකු බව ය. (5) ජුදයින්ගේ රජ බව ය.

**22.** "මද්දහනේදී රට පුරා අන්ධකාරයක් පහළ විය ..........." යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේගේ මරණය පිළිබඳව පෙර අනාවැකි ප්‍රකාශ කරන දිවැසිවරයා කවුද?
(1) යෙසායා (2) මීකා (3) සෙකරියා (4) ආමොස් (5) ජෙරමියා

**23.** ශුද්ධ වූ මතෙව් සුවිශේෂයට අනුව අරමිතියාවේ ජෝශප් යනු,
(1) ජේසුන් වහන්සේගේ අනුගාමිකයෙකුව සිටි පුද්ගලයෙකි.
(2) සැන්හෙඩ්‍රින් සභාවේ සාමාජිකයෙකි.
(3) සදාතනික ජීවිතය ගැන විමසූ පරිසිවරයා ය.
(4) ලාසරස් මළවුන්ගෙන් නැගිටීම පිළිබඳ සාක්ෂිකරුවෙකි.
(5) කුරුසිය රැගෙන යාමට ක්‍රිස්තුන් වහන්සේට උපකාර වූවෙකි.

**24.** විටෙක ක්‍රිස්තුන් වහන්සේ, නායක පූජකයාගේ ප්‍රශ්න කිරීම හමුවේ පිළිතුරු නොදීමෙන් පෙන්නුම් කළ කරුණක් වන්නේ,
(1) තම නිර්දෝෂීභාවය ඔප්පු කිරීම ය.
(2) තමන්ගේ බලය සහ සත්‍යතාව පෙන්නුම් කිරීම ය.
(3) එතුමා ලෞකික බලයෙන් නොව දේව බලයෙන් සන්නද්ධව සිටින බව පෙන්වීම ය.
(4) නායක පූජකයින්ට වඩා තමුන් වැදගත් පුද්ගලයකු බව පෙන්වීම ය.
(5) තමා පූජකයින්ගේ රජ බව පෙන්වීම ය.

**25.** ජොහන් 7:37-39 ට අනුව ක්‍රිස්තුන් වහන්සේ මහිමයට පත් වූ පසුව ආත්මයාණන් ලබා දෙන බව පොරොන්දු වේ. ඒ අනුව ශුද්ධාත්මයාණන් ලැබෙන්නේ,
(1) සකල ලෝකවාසීන්ට ය.
(2) තමන්ගේ ශ්‍රාවකයන්ට ය.
(3) ක්‍රිස්තුන් වහන්සේ මෙන් පැමිණෙන අයට ය.
(4) ඇදහිල්ලෙන් ජීවත් වන්නන්ට ය.
(5) ප්‍රේමයෙන් ජීවත් වන පිරිසට ය.

**26.** ශුද්ධ වූ පාවුලුතුමා ජෙරුසලමේදී විජාතිකයින්ගේ අත්වලට පාවාදීම පිළිබඳ ශුද්ධාත්ම මඟ පෙන්වීම තුළ අනාවැකි පැවසූ දිවැසිවරයා කවුද?
(1) සිමියොන් (2) අනනියස් (3) අගබස් (4) පාපස් (5) නාතාන්

**27.** පාස්කු මංගල්‍යය පැවැත්වීම පිළිබඳව නියමිත දිනයක් ස්ථිර කළ මන්ත්‍රණ සභාව කුමක් ද?
(1) ත්‍රිදෙන්තීනු (2) දෙවන වතිකාන (3) එපීස (4) කැල්සිඩොන් (5) නිසියානු

**28.** එව්ටිකස්ගේ මතය වේද භේදයක් බව පෙන්වා දුන් රදගුරුතුමා වන්නේ,
(1) ශුද්ධ වූ අතනේසියස්තුමා ය.
(2) ශුද්ධ වූ සිරිල්තුමා ය.
(3) ශුද්ධ වූ ඔරිගන්තුමා ය.
(4) ශුද්ධ වූ ජ්ලෙවින්තුමා ය.
(5) ශුද්ධ වූ එව්සේබියස්තුමා ය.

**29.** කිතුදහම උසස් බව පෙන්වීමට 'ඇපොලෙජටිකුස්' ග්‍රන්ථය රචනා කළේ,
(1) ශුද්ධ වූ ජස්ටින්තුමා ය.
(2) ශුද්ධ වූ ටර්ටුලියන්තුමා ය.
(3) ශුද්ධ වූ ඔරිගන්තුමා ය.
(4) ශුද්ධ වූ අගුස්තිනුතුමා ය.
(5) ශුද්ධ වූ අතනාසියස්තුමා ය.

**30.** ක්‍රි.ව. 1073 දී VII වන ග්‍රෙගරි නමින් ශුද්ධෝත්තම පියතුමා ලෙස පත් වූයේ කවුද?
(1) වොල්සේ කාර්දිනල්තුමා
(2) වින්ෆ්‍රීඩ් කාර්දිනල්තුමා
(3) මෙතෝඩියස් කාර්දිනල්තුමා
(4) ඩේමියානෝ කාර්දිනල්තුමා
(5) හිල්ඩෙබ්‍රෑන්ඩ් කාර්දිනල්තුමා

**31.** ස්වාමීන් වහන්සේගේ අන්තිම රාත්‍රී භෝජනය "හුදෙක් සැමරුමක් පමණය" යන්න ප්‍රකාශ කළේ,
(1) මාටින් ලූතර් ය.
(2) ජෝන් කැල්වින් ය.
(3) ස්වින්ග්ලි ය.
(4) ජෝන් ෆිෂර් ය.
(5) තෝමස් මුවර් ය.

**32.** ප්‍රතිසංස්කරණවාදී සභාවල පවා ප්‍රශංසාවට ලක් වූ ශුද්ධ වූ පීටර් කැනීෂියස්තුමන් විසින් රචිත ග්‍රන්ථය කුමක් ද?
(1) කතෝලික විශ්වාසයේ ධර්මෝපදේශය
(2) අධ්‍යාත්මික පුහුණුව
(3) ත්‍රිදෙන්තීනු ධර්මෝපදේශය
(4) පූර්ණ දිවියකට මඟ
(5) කිතුනු ආගමික සංහිදියාව

**33.** ප්‍රංශය සහ බෘසියය අතර යුද්ධය ඇතිවීම නිසා අත්හිටවනු ලැබූ මන්ත්‍රණ සභාව කුමක් ද?
(1) ත්‍රිදෙන්තීනු (2) ෆ්ලොරන්ස් (3) පළමු වතිකාන (4) පැරිස් (5) දෙවන වතිකාන

**34.** 1929 දී ඉතාලි රජය සමඟින් ලතරානු ගිවිසුම අත්සන් කරන ලද්දේ,
(1) XXIII වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා ය.
(2) VI වන පියුස් ශුද්ධෝත්තම පියතුමා ය.
(3) VII වන පියුස් ශුද්ධෝත්තම පියතුමා ය.
(4) XIII වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා ය.
(5) XI වන පියුස් ශුද්ධෝත්තම පියතුමා ය.

**35.** 13 වන සියවසේ ලෝකයේ පැවති ප්‍රධාන විශ්ව විද්‍යාල හතරෙන් එකක් වූ සලමන්කා විශ්වවිද්‍යාලය ආරම්භ කරනු ලැබුවේ කවුද?
(1) IX වන අල්පොන්සු රජතුමා
(2) IV වන ඇලෙක්සැන්ඩර් ශුද්ධෝත්තම පියතුමා
(3) චාල්ස්මෙන් රජතුමා
(4) IV වන ඇලෙක්සැන්ඩර් රජතුමා
(5) මහා ඇල්ෆඩ් රජතුමා

**36.** රෝමයේ සාන්ත පීතර බැසිලිකාවේ පූජාසනයට ඉහළින් ඇති ලෝකඩ උඩු වියන නිර්මාණය කළේ,
(1) ලියනාඩෝ ඩාවින්චි ය.
(2) ෆ්‍රා ඇන්ජලිකෝ ය.
(3) රෆායෙල් සෙන්සියෝ ය.
(4) ලොරෙන්සෙන් බර්නීනි ය.
(5) මයිකල් ඇන්ජලෝ ය.

**37.** පෘතුගීසින්ගේ උදව් පතා කිතුදහම වැළඳගත් නමුත්, සීතාවක රාජසිංහ රජුගේ ආක්‍රමණ නැවතුනු පසු ආගම ප්‍රතික්ෂේප කළ සිංහල රාජ පුත්‍රයා කවුද?
(1) කරලියද්දේ බණ්ඩාර
(2) දොන් ජුවන් යමසිංහ
(3) වීරසුන්දර බණ්ඩාර
(4) ජයවීර බණ්ඩාර
(5) පිලිප් යමසිංහ

**38.** වසර 1903 දී ගාල්ලේ රදගුරුව සිටි අති උතුම් ජෝශප් වැන්රින් හිමියන් විසින් ආරම්භ කළ දේශීය පැවිදි නිකාය කුමක් ද?
(1) සුරදූතික සොයුරියන්ගේ නිකාය (2) මරියතුමියගේ ෆ්‍රැන්සිස්කාන ධර්මදූතවරියන්ගේ නිකාය
(3) දිළිඳුන්ගේ කුඩා සොයුරියන්ගේ නිකාය (4) අපොස්තලික කාර්මේල් සොහොයුරියන්ගේ නිකාය
(5) ශ්‍රී කුරුසියේ තාපසිකාවන්ගේ නිකාය

**39.** පහත දක්වා ඇත්තේ යටත් විජිත යුගයේ දී මෙරට අධ්‍යාපනය තුළ දක්නට ලැබුණු පාසල් වර්ග කිහිපයකි.
A - දේවස්ථානයට අනුබද්ධිත පාසල්
B - මිෂන් පාසල්
C - දෙව්සත්හල් (සෙමනේරි)
D - අනාථ නිවාස
E - පිරිවෙන් පාසල්
ලන්දේසි යුගයේ දී දක්නට ලැබුණු පාසල් වර්ග පමණක් අඩංගු වරණය කුමක් ද?
(1) A, B, C (2) A, C, D (3) A, C, E (4) B, C, D (5) C, D, E

**40.** 'පාදුකාවලන්' යනු,
(1) ශ්‍රී ලංකාවේ පැරණිතම දෙමළ ක්‍රිස්තියානි සඟරාව යි.
(2) ශ්‍රී ලංකාවේ ඉපැරණිම සඟරාව යි.
(3) ශ්‍රී ලංකාවේ පැරණිතම පුවත්පත යි.
(4) මුල්ම දෙමළ කිතුනු 'නාටාර්' ලේඛනය යි.
(5) ශ්‍රී ලංකාවේ පළමුවන කතෝලික දෙමළ සඟරාව යි.

**41.** ශුද්ධ බයිබලයේ සුලබ අවස්ථා චිත්‍රයට නගමින්, මීගමුවේ මහවීදිය දෙව් මැදුරේ වෘත්තාකාර සිවිලිම නිර්මාණය කළ බෞද්ධ කලාකරුවා කවුද?
(1) එන්.එස්. ගොඩමාන්න (2) බෙෂෙල් නවරත්න
(3) පෝල් නවරත්න (4) මුහන්දිරම් මුදියන්සේ
(5) සෝලියස් මැන්දිස්

**42.** බ්‍රිතාන්‍ය යුගයේ, මෙරට දරුණු කොළරා වසංගතයක් පවතින අවස්ථාවක රෝගීන්ට උපස්ථාන කරමින් සිටිය දී එම රෝගයටම ගොදුරු වී ස්වර්ගස්ත වූයේ නිමල මරිය නිකායික
(1) ගරු ජෙරමියෝ පියතුමා ය. (2) ගරු නොබිලේ පියතුමා ය.
(3) ගරු ජෝශප් කරවල්ලෝ පියතුමා ය. (4) ගරු පියරේ බෙර්ගුවින් පියතුමා ය.
(5) ගරු ෆීලික්ස් ඇලෙක්සැන්ඩර් පියතුමා ය.

**43.** අපොස්තලික යුගයේ පව්කමාව ලබාගැනීම සඳහා හෘදයාංගම පශ්චත්තාපය මෙන්ම අවශ්‍ය වූයේ,
(1) තමන් කළ පාපයන් උච්චාරණය කිරීමයි. (2) අධ්‍යාත්මික සූදානමයි.
(3) එක්වරු සීලය රැකීමයි. (4) නළලෙහි අළු තවරා ගැනීමයි.
(5) හස්ත පිරිසිදු කර ගැනීමයි.

**44.** පෙරදිග කතෝලික පිළිවෙතෙහි ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,
(1) ගාම්භීර බවයි. (2) මනා සංයමකින් යුක්තවීමයි. (3) සාම්ප්‍රදායික බවයි.
(4) බුද්ධිගෝචර බවයි. (5) උසස් ගුණාත්මක බවයි.

**45.** "මහත් ගැලවීමේ ක්‍රියාදාමයට සෘජු ලෙසම සම්බන්ධ වන ඒකකයක්" ලෙසින් සභාව පිළිබඳව හඳුන්වා දී ඇත්තේ,
(1) ගිව්රාන් ය. (2) සාන්ත සිප්‍රියන්තුමා ය.
(3) සාන්ත තෝමස් ඇක්වයිනස්තුමා ය. (4) කාල් රානර් ය.
(5) සාන්ත අගුස්තීනුතුමා ය.

**46.** දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට කරන ලද වන්දනාචාර මෙන්ම එයට සම්බන්ධ විවිධ භක්ති අභ්‍යාස පිළිබඳව අවධානය යොමු කර ඇති විශ්ව ලේඛනය කුමක් ද?
(1) මිස්ටිරියුම් ෆිදෙයි (2) එක්ලේසියා දි එයුකාරිස්තියා
(3) ලූමෙන් ජෙන්සියුම් (4) සක්‍රමෙන්ටුම් යුනිටාටිස්
(5) මිදියාතෝර් දෙයි

**47.** ශුද්ධ වූ ලූක්තුමා හා ශුද්ධ වූ පාවුලුතුමන්ලා පවසන "ක්‍රිස්තුන් වහන්සේ පූජාය හා පාත්‍රය මතුපිට තුති පිදූ බවයි". මෙය අයත් වන සම්ප්‍රදාය කුමක් ද?
(1) ඇලෙක්සැන්ඩ්‍රියා (2) පලස්තීනු (3) අම්බ්‍රෝසියානු
(4) ගලිකානු (5) සෙල්තික

**48.** "මිනිසාගේ උතුම්කම රඳා පවතිනුයේ ඔහුටම විශේෂිත හෘදය සාක්ෂිය නිසා ය" යනුවෙන් මනුෂ්‍යත්වයේ උසස් බව පිළිබඳව දක්වන්නේ,
(1) කතෝලික සභා ධර්මෝපදේශයයි.
(2) කතෝලික සභා මහෝපදේශයයි.
(3) වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව නැමති ව්‍යවස්ථාවයි.
(4) කිතුනු සභා ඒකත්වයේ ව්‍යවස්ථාවයි.
(5) ලෝක සාමය නැමති විශ්ව ලේඛනයයි.

**49.** බැප්ටිස්ට් සභාවේ මෙරට සේවය ආරම්භ වූ ප්‍රදේශය කුමක් ද?
(1) ගාල්ල (2) ග්‍රෑන්ඩ්පාස් (3) කුරුණෑගල (4) මෝදර (5) මහනුවර

**50.** කිතුනු නොවන අන්‍යාගම් කෙරෙහි ශුද්ධ වූ සභාවේ දැක්ම සහ ආකල්පය පිළිබඳව අවධානය යොමු කිරීම සඳහා ලේකම් කාර්යංශයක් ස්ථාපිත කිරීමට මූලික වූයේ,
(1) XI වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා ය.
(2) XIII වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා ය.
(3) II වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය.
(4) VI වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය.
(5) XXIII වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා ය.

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2018

විෂයය අංකය / பாட இலக்கம் **43** විෂයය / பாடம் **ක්‍රිස්තියානි ධර්මය**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 4 | 21. | 5 | 31. | 3 | 41. | 1 |
| 02. | 1 | 12. | 2 | 22. | 4 | 32. | 1 | 42. | 5 |
| 03. | 4 | 13. | 2 | 23. | 1 | 33. | 3 | 43. | 1 |
| 04. | 2 | 14. | 3 | 24. | 2 | 34. | 5 | 44. | 3 |
| 05. | 3 | 15. | 2 | 25. | 3 | 35. | 1 | 45. | 5 |
| 06. | 4 | 16. | 3 | 26. | 3 | 36. | 4 | 46. | 5 |
| 07. | 3 | 17. | 1 | 27. | 5 | 37. | 4 | 47. | 2 |
| 08. | 5 | 18. | 4 | 28. | 4 | 38. | 1 | 48. | 3 |
| 09. | 4 | 19. | 2 | 29. | 2 | 39. | 2 | 49. | 2 |
| 10. | 2 | 20. | 1 | 30. | 5 | 40. | 5 | 50. | 4 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50 = 100

# අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2018

# 43 - ක්‍රිස්තියානි ධර්මය

## විසඳුම් හා ලකුණු දීමේ පටිපාටිය

## 1 කොටස

1. **(I). ශුද්ධ බයිබලය තුළ අඩංගු ප්‍රධාන කරුණු හතර දක්වන්න**

- දෙවිඳුන් හා මිනිසා අතර ආදර කථා පුවත.
- මිනිස් ස්වභාවය.
- දේව අභිමතය.
- ගැලවීමේ මාර්ගය හෝ සැලැස්ම පිළිබඳ කරුණු.
- ඇදහිල්ලේ ජීවිතය සවිමත් කර ගැනීමට ඉවහල්වන බව.
- දේව ක්‍රියාකාරීත්වය ක්‍රිස්තුන් වහන්සේ තුළින් පූර්ණත්වයට පත්වන බව.
- පරිහානියට පත්වූ මිනිසාට විමුක්තිය ලබා ගත හැක්කේ කෙසේද යන්න පිළිබඳව.

**(ii). ඊශ්‍රායෙලයේ ගැලවීමේ ඉතිහාසය තුළ දිවැසිවර සංකල්පයේ වර්ධනයක් සිදු වී ඇති බව සනාථ කිරීමට කරුණු හතරක් සඳහන් කරන්න**

- අනාගතය ගැන කියන්නෙකු වුවත් සරලව අදහස් ප්‍රකාශ කරන්නෙකි.
- රජතුමාට මඟ පෙන්වන්නෙක් හෙවත් උපදෙස් දෙන්නෙකි.
- සමාජ සාධාරණත්වය වෙනුවෙන් කටයුතු කරන්නෙකි.
- දේව පණිවුඩය ගෙන යන්නෙකි.
- විශේෂයෙන් විප්‍රවාසයේ දී ජනතාවට බලාපොරොත්තුවක් දී දිරිමත් කරන්නෙකි.
  **(දිවැසිවර භූමිකාව පිළිබඳව නිර්වචනය කර තිබුවද ලකුණු ලබා දෙන්න)**

**(iii). ශුද්ධ වූ පාවුලු තුමාගේ පළමු ධර්මදූත චාරිකාවේ ලුස්ත්‍රාවේදී සිදු වූ වැදගත් සිදුවීම් හතරක් ලියන්න**

- දේශනා කිරීම
- ඇවිදගත නොහැකි මනුෂ්‍යයාට සුවය
- ජුදෙව්වන් පාවුලුට ගල් ගසා නුවරින් පිටතට ඇමීම
- දර්බයට යෑම

**(iv). මධ්‍යතන යුගයේ ශුද්ධ ලියවිල්ල හැදෑරීමේදී භාවිත කළ සිව්විධ විග්‍රහයන් දක්වන්න**

- ව්‍යංගය
- අධ්‍යාත්මිකරණය
- ආචාරිකරණය
- සාහිත්‍යමය විග්‍රහය

**(v). ලන්දේසි යුගයේදී මෙරට තුළ සේවය කළ පිලිප්පුස් බල්දේවුස් දේවගැතිතුමා විසින් ඉටු කරන ලද සේවාවන් හතරක් ලියන්න**

- පළමුව ගාල්ලේ ඕලන්ද සේනාංකයේ පූජක සේවාව බාරව ක්‍රියා කළ අතර ඉන් පසුව යාපනයේ සේවය කළේය.
- ආගමික පොත්පත් දේශීය භාෂාවලට පරිවර්තනය කර මුද්‍රණය කිරීමට පියවර ගත්තේය.
- කතිකිස්තවරුන් (ආගමික උපදේශකවරුන්) පුහුණු කළේය.
- සෑම දේවස්ථානයක් ආශ්‍රිතවම පැරිෂ් පාසලක් ආරම්භ කිරීම.
- රජයේ අනුග්‍රහය ඇතිව ධර්ම ප්‍රචාර කටයුතු සංවිධාන කළේය.

**(ලකුණු 4 x 5 = 20)**

2.

**(i). නික්මයාම 15:1-21 දක්වා කොටස තුළ සඳහන් මෝසෙස්ගේ ජය ගීතයේ අඩංගු ප්‍රධාන කරුණු හතර සඳහන් කරන්න**

- සමිඳාණන් අපගේ බලය වන බව.
- පාරාවෝගේ උදම් ඇනීම තුළ වුවද ඔහු අන්ත ලෙස පරාජයට පත් වූ බව.
- දෙවියන්ගේ බලය ඉදිරියේ උන්වහන්සේට විරුද්ධ වන අය ත්‍රාසයට හා භීතියට පත් වන බව.
- දේව ජනතාව උන්වහන්සේට තුති ගී ගායනා කළ යුතු බව.

**(ii). ප්‍රතිහාර්යයක් යනු මොනවාදැයි පැහැදිලි කෙරෙන කරුණු හතරක් සඳහන් කරන්න**

- ඒවා විශ්වාසයේ පසුබිමක් මත ක්‍රියාත්මක වේ.
- ඒවා මගින් ක්‍රිස්තු පෞරුෂය එළිදරව් වේ.
- දේව රාජ්‍යයේ උදාව සනිටුවහන් වේ.
- මනුෂ්‍යයන් වෙත දෙවියන් වහන්සේගේ දයා කරුණාව අනාවරණය වේ.

**(iii). XIII වන ලියෝ ශුද්ධොත්තම පියතුමා 1878-1903 කාලයේ දී තමා විසින් රචිත විශ්ව ලේඛන සඳහා තේමා කර ගත් විෂයයන් හතරක් සඳහන් කරන්න**

- විශ්වාසය හා බුද්ධිවාදය.
- ශුද්ධ වූ සභාව හා රජය.
- සමාජවාදය භයානක බව.
- විවාහයේ ශුද්ධවත් බව, අයිතිය හා බලය.
- කම්කරු අයිතිවාසිකම් .

**(iv). බ්‍රිතාන්‍ය යුගයේ දී උදා වූ පූර්ණ ආගමික නිදහසින් ප්‍රයෝජන ගැනීම පිණිස මෙරට ඔරතෝරියානු නිකායික පියවරුන් ක්‍රියා කළ ආකාරය පෙන්වීමට කරුණු හතරක් දක්වන්න**

- සභාවට අයිති දේපළ නැවත ඉල්ලා සිටීම.
- සභාවේ කටයුතු පුනරුත්ථාපනය.
- කැඩී බිඳී ගිය දේවස්ථාන නැවත ගොඩනැගීම.
- කිතුනු වත්පිළිවෙත් සංවිධානය කිරීම.
- මෙරට කිතුනු ජනයා ඒකරාශී කිරීම.

**(v). පසු කාලීනව ජනවන්දනාවට රෝම සංස්කෘතික මූලාශ්‍රවලින් ලැබුණු ආභාෂ හතරක් සඳහන් කරන්න**

- පූජා ඇඳුම්
- පහන් සහ දුම් පූජා
- ජනවන්දනා යැදුම්
- ලතින් භාෂාව
- ග්‍රෙගෝරියානු ගායන සම්ප්‍රදාය
- විවාහ හා අවමංගල්‍ය සිරිත් විරිත්

**(ලකුණු 4 x 5 = 20)**

3.

**(i). යෙසායා 11:1-9 ට අනුව සාම රාජ්‍යයේ ලක්ෂණ හතරක් සඳහන් කරන්න**

- දාවිත්ගේ පෙළපතේ රාජාංකුරයකින් සාම රාජ්‍යය හටගන්නේය.
- සමිඳුන්ගේ ආත්මානුභාවය වන ප්‍රඥාව ද, නුවණ ද, අනුශාසනා බුද්ධිය ද බලය හා දැන ගැනීම ද දේව ගරුබිය ද එතුමන් කෙරෙහි පිහිටුවන්නේය.
- සාධාරණ විනිශ්වයක් දීම සිදුවන්නේය.
- අයිතිවාසිකම් ආරක්ෂා කරදීම සිදුවන්නේය.
- කීකරු වූ විශ්වාසවන්තකම මගින් මෙසියස් වහන්සේගේ අධිකාරියේ බලය ප්‍රකාශ වන්නේය.
- වෘකයා හා බැටළුවා අතර සම්බන්ධය මගින් සාම රාජ්‍යයේ සලකුණු පෙන්වා දෙන්නේය.

**(ii). ක්‍රි.ව. 431 දී පැවැත්වූ එපීසියේ මන්ත්‍රණ සභාවේ දී නෙස්ටෝරියන්වාදයට විසඳුම් පිණිස ගන්නා ලද මූලික තීරණ හතර දක්වන්න**

- ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ ඇත්තේ එක පෞරුෂයකි. එනම් එතුමාණෝ එක පුද්ගලයෙක් වන්නාහ.
- එතුමන් තුළ දේව ස්වභාවයත් මනුෂ්‍ය ස්වභාවයත් ඒකාබද්ධව පවතී.
- එතුමන් සැබෑ දේව පුත්‍රයා වන අතර සැබෑ මනුෂ්‍ය පුත්‍රයා ද වේ.
- මරිය තුමියගේ කුසෙහි මනුකය ගෙන පිළිසිඳ ගත්තේ දේව පුත්‍රයා වන ජේසුස් වහන්සේ නිසා එතුමියට "දෙව් මව්" යැයි කිව හැකිය.

(iii). මැත කාලයේදී රෝමයේ සිදු කළ කැනීම්වලින් සොයා ගෙන ඇති දොමිනිල්ලාගේ සොහොන් ගැබේ තිබී හමු වූ ක්‍රිස්තියානි බිතුසිතුවම්වලට තේමා වී ඇති බයිබලීය කතාන්දර හතරක් නම් කරන්න

- ආදම් සහ ඒව.
- මෝසෙස්ට පර්වතයකින් ජලය ලබාදීම.
- ජෝනා තල්මසකුගෙන් බේරීම.
- සිංහයින්ගෙන් දානියෙල් ආරක්ෂා වීම.
- ජේසුස් වහන්සේ හා ගෝලයින් දක්වන චිත්‍රය.

(iv). පහත සඳහන් එක් එක් තාපස නිකායෙහි නිර්මාතෘවරුන් නම් කරන්න

- සෙල්ටික් : ශුද්ධ වූ කොලුම්බා මුනිඳුන්.
- කැමල්ඩොලෙස් : ශුද්ධ වූ රොමෝල්ඩ් මුනිඳුන්.
- කාර්තුෂියන් : ශුද්ධ වූ බෲනෝ මුනිඳුන්.
- සිස්ටර්ශියන් : රොබට් තාපසතුමා.

(v). මෙරට කිතුනු සභා සංවාදයේ සාධනීය ලක්ෂණ හතරක් දක්වන්න

- 1983 දී නව සිංහල ශුද්ධ බයිබලය සම්පාදනය කිරීම.
- විශ්ව සභාව හා සම්බන්ධ වී, සෑම වසරකම ජනවාරි මාසයේ සභා සමගිය උදෙසා කෙරෙන යැදුම් සතිය.
- ආගමික, සාමාජීය කටයුතුවලදී සුහදතාවයෙන් කටයුතු කිරීම.
- දේව ධාර්මික එකඟතා මුල්කරගෙන සිදුවන ශාස්ත්‍රීය හා ධාර්මික සාකච්ඡා හා සංවාද
- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ. පෙළ) විභාගය සඳහා සෑම කිතුනු සභාවකටම පොදු වූ විෂයය නිර්දේශයක් සැකසීමට හැකිවීම.

**(ලකුණු 4 x 5 = 20)**

# II කොටස

**අභිමතාර්ථ: සුභාරංචි අධ්‍යනය කිරීම මගින් දේව රාජ්‍යයේ වටිනාකම් කිතුනු ජීවිතයට වැදගත් වන ආකාරය ක්‍රියාවට නැංවීමට නැඹුරු කරයි.**

4.

**(i). සමදර්ශක සුභාරංචිවල කතෘත්වය සහ රචනා වූ කාලය සම්බන්ධව ඉදිරිපත් වී ඇති නිගමන පහක් කෙටියෙන් විස්තර කරන්න**

- මතෙව් ප්‍රථම ශුභාරංචියයි
  - ✓ මාක් හා ලූක් සුභාරංචි ලියවී ඇත්තේ මතෙව් සුභාරංචිය කරණ කොටගෙනය.
  - ✓ අරමීය භාෂාවෙන් මතෙව්තුමා ලියූ ජේසුස් වහන්සේගේ දේශනා පසුව එතුමා ග්‍රීක භාෂාවට පරිවර්තනය කර ඇත.
  - ✓ වර්තමානයේ මෙම මතය පිළි නොගනී.
- මුඛ පරම්පරානුගත කථා
  - ✓ සුභාරංචි ලේඛන ගත කිරීමට පෙර අපෝස්තුළුවරුන්ගේ දේශනා එකම ආකාරයෙන් අරමීය හා ග්‍රීක බසින් ලියන ලද බව.
  - ✓ ශුද්ධ වූ සභාව විවිධ ප්‍රදේශවල ව්‍යාප්තවීමත් සමග, එය දේශනා කළ ප්‍රදේශ අනුව සුළු වෙනස්කම්වලට ලක්විය.
  - ✓ එකම ආකාරයේ මුඛ පරම්පරානුගත කථා සමහරක් සුළු වෙනස්කම්වලට භාජනය වී වෙනස් වෙමින් ද තවත් ඒවා වෙනස් නොවෙමින් ද දේශනා කර ඇත.
  - ✓ පලස්තීනයේ මුඛ පරම්පරානුගත කථා මතෙව්තුමා සුභාරංචියක් ලෙස ලිවීය.
  - ✓ රෝමයේ පිළිපැදි සම්ප්‍රදායන් අනුව මතෙව්තුමා තම සුභාරංචිය ගොඩනගා ඇත.
  - ✓ අන්තියෝකියේ හෝ පාවුලුතුමා ස්ථාපිත කළ සභාවල තිබූ පාරම්පරික සම්ප්‍රදායන් ලූක්තුමා තම සුවිශේෂයට ඇතුළත් කර ඇති බව.
- මාක් මුල් සුභාරංචියයි
  - ✓ මතෙව් සහ ලූක් සුභාරංචිවලට මාක් සුභාරංචිය මූලාශ්‍ර විය.
  - ✓ 18 වන සියවස වනතෙක් මතෙව් සුභාරංචිය මුල් සුභාරංචිය ලෙස පිළිගනු ලැබීය.
  - ✓ 18 වන සියවසේදී මාක් සුභාරංචිය ප්‍රථම අපෝස්තලිකයින්ගේ අත්පොත වූ බවද අනෙක් සුභාරංචිවලට ප්‍රථම ලියූ බවද, ආරම්භක සම්ප්‍රදායන් වලට වඩා සමීප බවද ස්ථිර ලෙස නිගමනය කරති.
  - ✓ මෙම මතය බොහෝ බයිබල් විශාරදයින් පිළිගත්හ.
- ද්වි ලේඛන සම්ප්‍රදාය
  - ✓ 1833 ජේ. හුවයිස් නැමැත්තා මේ සම්ප්‍රදාය ඉදිරිපත් කර ඇත.
  - ✓ පසුව එච්. ජේ. හෝල්ස්මන් නැමැත්තා විසින් එය ප්‍රසිද්ධ කරන ලදි.
  - ✓ මාක් සුභාරංචිය මුලින් ලියා ඇති අතර මතෙව් හා ලූක් එය මූලාශ්‍ර කරගෙන සිය ලේඛනයන් ඉදිරිපත් කර ඇත.
  - ✓ මතෙව් හා ලූක් Q මූලාශ්‍රය උපයෝගී කරගෙන ඇත.
- චතුර්විධ ලේඛන සම්ප්‍රදාය
  - ✓ මාක් සුභාරංචිය මුලින්ම ලියවී ඇත.
  - ✓ මතෙව් හා ලූක් මාක් සුභාරංචිය උපයෝගී කරගෙන ඇත.
  - ✓ මතෙව් හා ලූක් Q මූලාශ්‍රයද උපයෝගී කරගෙන ඇත.
  - ✓ මතෙව් කතුවරයාට විශේෂ වූ සොයා ගැනීම් M සම්ප්‍රදාය ලෙසද ලූක් කතුවරයාට විශේෂ වූ සොයා ගැනීම් L සම්ප්‍රදාය ලෙසද හැඳින්වේ.

**(නිගමන 5 කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු 5x2 = ලකුණු 10 යි)**

**(ii). ක්‍රිස්තුන් වහන්සේගේ කන්ද උඩ දේශනාව කිතුනු ඔබගේ ජීවිතයට වැදගත් වන්නේ කෙසේදැයි එහි පරමාර්ථ ආශ්‍රයෙන් උදාහරණ පහක් දෙමින් පැහැදිලි කරන්න.**

- දේව රාජ්‍යයට ඇතුළුවීම සඳහා අවශ්‍ය සුදුසුකම් කන්ද උඩ දේශනාව තුළ අන්තර්ගත වේ.
- දේව රාජ්‍යයේ වටිනාකම් තම ජීවිතයේ හරය කර ගනිමින් ධර්මිෂ්ඨ දිවියක් ගෙවන්නට ආරාධනා කරයි.
- අපගේ ජීවිතවල ඇති පරිසි ගති දුරලා බාහිර ආටෝප පසෙකලා දෙවිඳුන් ඉදිරියෙහි බැහැපත්කමින් කටයුතු කිරීමට වෑයම් කිරීම.
- සැබෑ ඇතුළාන්ත පිරිසිදුකමකින් යුතුව දේව රාජ්‍යයේ වටිනාකම් සමාජ ගත කිරීමට කැපවීම.
- ප්‍රේමයේ නව ව්‍යවස්ථාවට පංගුකාර වෙමින් සමාජයේ පොදු යහපත වෙනුවෙන් වැයවීම.
- සිය අසල්වැසියා හා දෙවියන් වහන්සේ ඉදිරියේ වචනයෙන් නොව ක්‍රියාවෙන් ක්‍රිස්තු ගුණාංග පිළිබිඹු කිරීම.
- සියල්ලෙහිදී දෙවිඳුන් මත යැපෙමින් ක්‍රියා කිරීමට වෙහෙස වීම.
- එදිනෙදා වැඩකටයුතුවලදී පෞද්ගලික වාසි ප්‍රයෝජන පසෙකලා අවංක වූ පිරිසිදු සිතින් දෙවිඳුන් තුළ සැනසීම බලාපොරොත්තු වීම.
- සාමය සිහිනයක්ව පවතින සමාජයක සැබෑ අර්ථවත් කිතුනුවෙකු වන්නට වැඩ කිරීම.
- පැමිණෙන අභියෝග හමුවේදී සියල්ල දෙවිඳුන් වෙනුවෙන් දරා ගැනීමට උත්සුක වීම.

**(ක්‍රිස්තුන් වහන්සේගේ කන්ද උඩ දේශනාව කිතුනු ජීවිතයට වැදගත් වන ආකාරය එහි පරමාර්ථ ආශ්‍රයෙන් උදාහරණ 5 ක් ඇසුරින් පැහැදිලි කර ඇත්නම් ලකුණු 10 දෙන්න )**

**අභිමතාර්ථ :** අධ්‍යාපනය දියුණු කිරීම සඳහා සභාවේ දායකත්වය අධ්‍යයනය කරමින් බහු ආගමික පරිසරයක් තුළ ජීවත් වන සිසු සිසුවියන්ට ආගමික සංහිඳියාව වර්ධනය කිරීමේ වගකීමෙන් අධ්‍යාපනය සඳහා සභා මෙහෙවර ඇගයීමට මඟ පෙන්වීම

5.

**(i). "එදා ශුද්ධ වූ සභාව යුරෝපය තුළ අධ්‍යාපනය දියුණු කිරීමට ගත් උත්සාහය යුරෝපයට මෙන්ම සමස්ත ලෝකයටම වැදගත්විය." මෙම ප්‍රකාශනයට අදාළව අධ්‍යාපනය සඳහා කිතුනු සභාවේ කැපවීම කරුණු පහකින් පැහැදිලි කරන්න**

- රෝම අධිරාජ්‍යය තුළ ඇතිවූ දේශපාලනික අරගලය හේතුවෙන් යුරෝපයේ දැනුම පුපුරා ගිය ද පූජකවරුන් තමන්ට අවශ්‍ය දැනුම පෝෂණය කිරීමට උනන්දු වීම.
- මධ්‍යතන යුගය තුළ අක්ෂර ඥානය වර්ධනය කිරීම.
- ක්‍රි.ව. 800 දී පමණ වාල්ස් මෙන් රජකාලයේ සෑම දෙව්මැදුරක්ම, තාපසාරාමයක්ම අයත් ප්‍රදේශවල ප්‍රාථමික පාසල් ආරම්භ කිරීම.
- බටහිර යුරෝපයේ විවිධ ප්‍රදේශවල තාපසාරාම ආශ්‍රිත ප්‍රදේශවල පුස්තකාල ස්ථාපනය කිරීම.
- එකළොස්වන සියවසේ ඇති වූ ආගමික ප්‍රතිසංස්කරණයේ ප්‍රතිඵලයක් ලෙස ආසන දෙව්මැදුරු ආශ්‍රිත පාසල්වල නිදහස් අධ්‍යාපනය ලබාදීම (කැන්ටබරි, චාර්ටස්, පැරිස්).
- ගිහි ජනතාව සඳහා පාසල් ඇතිවීමත් සමග ගිහි ජනතාවගේ අධ්‍යාපනය වර්ධනය වීම.
- මධ්‍යතන යුගයේ යුරෝපය තුළ විශ්ව විද්‍යාල ඇති කිරීම, වෛද්‍ය විද්‍යාවට මුල්තැන දුන් බොලොන්ඤ්ඤා විශ්ව විද්‍යාලය ඇතිවීම.
- පුරාතන රෝම-ග්‍රීක දැනුමත්, ඉස්ලාමීය දැනුමත් යුරෝපය තුළට ගෙන ඒම.

- දේව ධර්ම පීඨ, වෛද්‍ය පීඨ, සභා නීති පීඨ, කලා පීඨ ඇතිවීම. පැරිස් විශ්ව විද්‍යාලයට අයත් පෞද්ගලික කොලෙජ් 40 ක් ආරම්භ කිරීම.
- වර්ෂ 872 දී ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය ආරම්භ කිරීම. වර්ෂ 1226 දී කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලය ආරම්භ කිරීම. වර්ෂ 1218 දී සලමන්කා විශ්ව විද්‍යාලය ආරම්භ කිරීම. මේ සියල්ල සමස්ථ ලෝකයටම වැදගත් වේ.

**(නිවැරදි කරුණු 5 කට 5 x 2 = 10)**

**(ii). ශුද්ධ වූ සභා මුල් යුගයේදී කිතුනුවන් හා ජුදෙව්වන් අතර ගැටුම්වලට තුඩු දුන් සාධක කෙටියෙන් පැහැදිලි කර මෙරට ආගමික සංහිඳියාව වර්ධනය කිරීම සඳහා යෝජනා පහක් විස්තර කරන්න**

➢ **කිතුනුවන් හා ජුදෙව්වන් අතර ගැටුම්වලට තුඩු දුන් සාධක**

- කිතුනුවන්ට විරුද්ධ වීමට හේතුව, ජුදෙව්වන් ජේසුස් වහන්සේ ව කුරුසපත් කිරීමට ඉදිරිපත් කළ හේතුන්ය.
- ජුදෙව්වන් විශාල හමුදාවක් සමග පැමිණීමෙන් මෙසියස් වහන්සේව බලාපොරොත්තුවීම නිසා උන්වහන්සේගේ ක්‍රියා, ඉගැන්වීම් ඒ බලාපොරොත්තුවට පටහැනි වීම. කිතුනුවන් ජේසුස් වහන්සේව මෙසියස් වහන්සේ වශයෙන් ද දේව පුත්‍රයා ලෙස ද පිළිගැනීම.
- කිතුනුවෝ ජේසුස් වහන්සේගේ මරණය පිළිබඳව ජුදෙව්වන්ට දොස් පැවරීම, දිවැසිවරුන් මරා දැමීම පිළිබඳ දොස් පැවරීම, මෝසෙස් මගින් කතා කළ ශුද්ධාත්මයාණන්ට ඔවුන් සවන් නොදුන් නිසා දොස් පැවරීම.
- රෝමවරුන් පෙරුසලම් දේව මාළිගාව බිඳ දැමීමට හේතුව කිතුනුවන් ජේසුස් වහන්සේව මෙසියස් ලෙස පිළිගැනීම නිසා බව ජුදෙව්වන් කියා සිටීම.
- කිතුනුවන් උත්ථානය පිළිබඳ විශ්වාස කිරීම, එය දේශනා කිරීම හා සාක්ෂි දැරීම ගැන ද ජුදෙව්වන් ප්‍රකෝපවීම.
- ජුදෙව්වන් මෝසෙස්ගේ නීතියට සහ දේව මාළිගාවට මුල්තැන දීම, කිතුනුවන් ප්‍රේමයේ පනතට මුල්තැන දීම.
- සද්දුසිවරුන්, පරිසිවරුන්, නායක පූජකයින් කිතු දහමේ ව්‍යාප්තිය නිසා තමන්ට හිමි ස්ථානය, රැකියාව අහිමි වේ යැයි බියෙන් කිතුනුවන්ව පිළිකුල් කිරීම.
- ස්තේපන් තුමාට විරුද්ධව නැගූ චෝදනා සඳහන් කිරීම.

➢ **ආගමික සංහිඳියාව සඳහා යෝජනා**

අප ජීවත්වන ශ්‍රී ලංකාව බෞද්ධ, හින්දු, ඉස්ලාම් සහ කතෝලික අනුගාමිකයින්ගෙන් හෙබි බහු ආගමික රටකි. එහෙයින් කිතුනුවන් වශයෙන් සෙසු ආගමික සැදැහැවතුන් සමඟ සංවාදයක යෙදෙමින් සහජීවනයෙන් කටයුතු කිරීම ඉතා වැදගත් වේ. ඒ සඳහා අපට කළ හැකි දෑ පහත පරිදි පෙළගැස්විය හැකිය.

- එදා ක්‍රිස්තුන් වහන්සේ ක්‍රියාකලාක් මෙන් අප ද අන්‍යාගම් හා අන්‍යාගමිකයින් ප්‍රතික්ෂේප නොකොට ඉවසීමෙන් සංවාදයේ නියැලීම.
- අන්‍යාගමිකයන් සමඟ ඇතිවන සංවාදය හේතුවෙන් උපදින අන්‍යෝන්‍ය තේරුම් ගැනීම, සුහදතාව සහ සහයෝගය මුල්කරගෙන ප්‍රේමයෙන් පිරුණු සමාජයක් ගොඩනැගීමට කටයුතු කිරීම.

- කිතුනු නොවූ ආගම්වල ඇති ඉගැන්වීම් තම ආගමික ඉගැන්වීම්වලට බොහෝ දේ වෙනස් වුවත් මෙම ආගම්වල ජීවිත ප්‍රතිපදාවත්, ධර්ම ඉගැන්වීම් සහ ධර්ම ශික්ෂණ ඉතා ඉහළින් අගය කිරීම.
- අන්‍ය ආගම්වල පවතින යහපත් සාරධර්ම හා වටිනාකම්වලට ගෞරවයෙන් සලකන අතරම අපගේ විශ්වාසය අනුව ජේසුස් ක්‍රිස්තුන් වහන්සේව වටහාගෙන උන්වහන්සේව හඳුනාගෙන ඒකාබද්ධවන්නට ලැබීම ගැන සතුටුවෙමින් එම අත්දැකීම අන්‍යයන් හා බෙදා ගැනීමට ද උත්සුකවීම.
- අප එසේ කළ යුත්තේ අන්‍යයන්ගේ ආගමික නිදහසට බාධා නොවන සේ, එම නිදහසට මහත්සේ ගරුකරමින්ය.
- අන්‍යාගමිකයන්ගේ අධ්‍යාත්මික හා ශීලධාර්මික සත්‍යතා සමාජීය ජීවිතය හා සංස්කෘතිය අගය කිරීමට හා සුරැකීමට කටයුතු කිරීම.
- ශ්‍රී ලංකාවේ සියලුම ආගමික ජනයා සහජීවනයෙන් කටයුතු කරමින්, එකිනෙකාට ගෞරවයෙන් හා ප්‍රේමයෙන් සම්බන්ධ වී සියලුදෙනාම එකම පරිසරයක කොටස්කරුවන් ලෙස අවබෝධ කරගනිමින් එකිනෙකාට උදව් උපකාර කරමින් සහජීවනයෙන් කටයුතු කළ යුතුය.

**(සාධක පහට ලකුණු 5 ක් ද, යෝජනා පහකට ලකුණු 5ක් ද වශයෙන් 5+ 5 = 10)**

**අභිමතාර්ථ:** විදේශීය ධර්මදූතවරුන්ගෙන් ශ්‍රී ලංකාවේ දහම් සේවකයින්ට ගත හැකි ආදර්ශයන් මැන බැලීමට හා අගය කිරීමට මඟ පෙන්වීම.

6.

**(i). පෘතුගීසි යුගයේ ලක්දිවට පැමිණි ධර්මදූතවරුන්ගෙන් සිදු වූ සේවය කරුණු පහකින් පැහැදිලි කරන්න**

| | | |
|---|---|---|
| ජේසු නිකායික ධර්මදූතවරුන්ට | - | මහ ඔයෙන් උතුර |
| අගොස්තීනු නිකායික ධර්මදූතවරුන්ට | - | සබරගමුව |
| දොමිනිකාන නිකායික ධර්මදූතවරුන්ට | - | සත් කෝරළය |
| ප්‍රැන්සිස්කාන නිකායික ධර්මදූතවරුන්ට | - | සෙසු ප්‍රදේශ සේවාව සඳහා පැවරිණි |

ඔවුන්ට පැවරුණු ප්‍රදේශවල සේවය කළ ධර්මදූතවරු ආගම ධර්මය ප්‍රචාරය කලා පමණක් නොව විවිධ සමාජ සේවාවන්හිද නිරතවීම.

- දෙව්මැදුරු අසල කුඩා පාසල් ඇති කරමින් දරුවන්ට මූලික අධ්‍යාපනය හා ආගම ධර්මය ඉගැන්වීම.
- ජේසු නිකායික පියවරුන් "කොලීජි" නමින් උසස් පාසල් කිහිපයක් අරඹා උසස් අධ්‍යාපනය සඳහා අවස්ථාව ලබාදීම.
- අධ්‍යාපනයට අමතරව අනාථ දරුවන් රැකබලා ගැනීම.
- රෝගීන්ට ඇප උපස්ථාන කිරීම.
- මහළු අය රැකබලා ගැනීම.
- කාර්මික පාසල් ආරම්භ කිරීම හා පුණ්‍යායතන පවත්වා ගෙන යෑම.

**(මෙවැනි කරුණු හෝ මීට සමාන කරුණු පහක් ලියා ඇත්නම් ලකුණු 5 x 2 =10 ලබා දෙන්න)**

**(ii). මනුෂ්‍යත්වයේ උසස් බව පිළිබඳ කතෝලික සභා ධර්මෝපදේශයෙහි සඳහන් ඉගැන්වීම් ඔබගේ ජීවිතයට සම්බන්ධ කරමින් කරුණු පහකින් පැහැදිලි කරන්න**

- දේව සමානකමට මවා ඇති මනුෂ්‍යයාගේ බුද්ධිය නිර්මාණකරණයට යෙදවීමෙන් මිනිසා මැවීමේ කාර්යයට දායක වී මැවිල්ල පූර්ණත්වය කරා ගෙන යාමට සහය දැක්වීම. මනුෂ්‍යයා “දෙයක්” නොව “කෙනෙක්” හෙවත් පුද්ගලයෙකි. මෙයින් මනුෂ්‍යයාගේ උත්තරීතර බව පෙන්වයි.
- දෙවියන් වහන්සේ සියල්ල මවා වදාළේ මනුෂ්‍යයා සඳහා ය. එහෙත් මනුෂ්‍යයා මවා ඇත්තේ උන් වහන්සේට සේවය කිරීමට, ආදරය කිරීමට හා සියලු මැවිල්ල නැවත උන්වහන්සේට ඔප්පු කිරීමට ය. එමනිසා අප නිතරම දෙවියන් වහන්සේට මෙන්ම අප සහෝදර සහෝදරියන්ට ආදරය දැක්වීම හා මැවිල්ල සංවර්ධනය කිරීමට නිතරම උත්සාහ කළ යුතුය.
- මිනිසාගේ උතුම්කම රඳා පවතින්නේ හෘද සාක්ෂිය නිසාය. එමනිසා දේව ආදරයෙන් යහපත හා සත්‍යයට සාක්ෂි දරමින් අයහපතින් හා අසත්‍යයෙන් වැළකී සිටීමට අප නිතරම කටයුතු කළ යුතුයි.
- ස්ව අවබෝධයෙන් හෙබි, සෙසු පුද්ගලයින් සමග සබඳතා පවත්වා ගනිමින්, මැවුම්කරුවාණන්ට විශ්වාසයේ හා ආදරයේ ප්‍රතිචාර දැක්වීමට ගිවිසුම් ජීවිතයකට කැඳවා ඇති අප නිතරම මැවිල්ලට නොව මැවුම්කරුවාණන්ට ආදරය කරමින් ශුද්ධාත්මයාණන් වහන්සේගේ මන්දිරයක් මෙන් කටයුතු කිරීම.
- ශරීරයකින් හා ආත්මයකින් හෙබි මනුෂ්‍යයා පාපයේ වහල් බවේ බැමි වලින් මුදා ගැනීමට ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ ජීවිතය පූජා කලාක් මෙන් අප සහෝදර සහෝදරියන්ගේ ප්‍රශ්න වලදී ඔවුන්ට සහනයක්, සැනසීමක් වීමට කටයුතු කළ යුතුයි.
- අප ශරීර දෙවියන් වහන්සේ විසින් මවනු ලැබූ නිසා අන්තිම දවසේ දී එය නැවත නැගිටුවන ලබන හෙයින් යහපත්, ගෞරවය ලැබීමට යෝග්‍ය වන ලෙස ක්‍රියා කළ යුතු අතර ශාරීරික ජීවිතය උසස් කොට සැලකිය යුතුය. මනුෂ්‍යයා තම ශරීරය දෙවියන් වහන්සේගේ මහිමය සඳහා යොදා ගත යුතුය.
- ශරීරයට හා මනුෂ්‍යත්වයට පටහැනිව සිදුවන වැරදි උදා: මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවීම, ගණිකා වෘත්තිය, සමලිංගික සේවනය, බාල අපචාර වැනි ක්‍රියාවලින් මිදීමට උපදෙස් ලබාදීම හා ඒ පිළිබඳව දැනුවත් කිරීම. එවැනි ක්‍රියාවන්ට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම.

**(මෙවැනි කරුණු හෝ මීට සමාන කරුණු පහක් ලියා ඇත්නම් ලකුණු 5 x 2 =10 ලබා දෙන්න)**

**අභිමතාර්ථ:** ශ්‍රී ලංකාවේ සභා ඉතිහාසය හදාරා ලාංකේය කිතුනු අනන්‍යතාවට සාක්ෂි දැරීම පිළිබඳ සිසු ආකල්ප පරීක්ෂා කිරීම.

7.

**(i). ශුද්ධ වූ ජුසේවාස් පියතුමා සිදුකළ දයා සේවාවන් පහක් සඳහන් කර කෙටියෙන් පැහැදිලි කරන්න**

- වසූරිය වසංගතයට ගොදුරු වූ රෝගීන්ට උවටැන් කිරීම.
- ගෙයින් ගෙට ගොස් රෝගීන්ට ඇප උපස්ථාන කිරීම.
- මෘත ශරීර භූමිදානය කිරීම.
- දිව්‍ය පූජාව ඔප්පු කිරීම හා දේව ප්‍රසාද නිධාන දානය කිරීම.
- හරබර දේශනාවන් මගින් කිතුනුවන් දහමින් පෝෂණය කිරීම.

- සංචාරක ධර්මදූත සේවය තුළ ගිහි නායකයින් මගින් දහම් සේවාව පවත්වාගෙන යාම. උදා: මුහුප්පු, අන්නවි
- ලන්දේසීන් විසින් කඩාබිඳ දමා තිබූ කිතුනු දේවස්ථාන යළි ගොඩ නඟා එහි දිව්‍ය පූජාව පැවැත්වීමට කටයුතු කිරීම.
- මහනුවර ජනතාව මුහුණදුන් දැඩි නියඟය නිමා කරමින් තම ප්‍රබල යාච්ඤාව නැමති අවියේ බලයෙන් වැසි වස්සවා සෙත සැලසීම.
- මහනුවර දේවස්ථානයෙන් පිටත දිනපතාම දුප්පතුන් වෙනුවෙන් සහල් බෙදාදීමේ සිරිත ඇති කිරීම.
- ශුද්ධ වූ ජුසේවාස් පියතුමා තමන් කෙතරම් කටුක දිවියක් ගත කළත්, තමා සමඟ සේවයේ නිරත වූ අනෙකුත් පියතුමන්ලාට දහම් සේවයේ නිරත වීමට ඇවැසි පහසුකම් හැකි පමණින් ලබාදීමට පියවර ගැනීම.
- මරණයකදී මියගිය ආත්මයන් වෙනුවෙන් යාච්ඤා කොට ආසිරි ගැන්වීම.
- විවිධ රෝගාබාධ හේතුවෙන් ගිලන්ව සිටින්නන් හා මහලු අය බැහැදැක ඔවුන්ට ඇවැසි මානසික හා ආත්මීක සුවය දානය කිරීම. අවස්ථා ගණනාවකදී අති දුෂ්කර මාර්ගයන් ඔස්සේ දුර බැහැර සිටි රෝගීන් පවා බැහැදැකීමට යාමට උන්වහන්සේ පුරුදු ව සිටියහ.
- නත්තල, නව වසර උදාව හා පාස්කුව යන අවස්ථාවලදී ජනතාව සමඟ එකතුව සමරමින් ඊට නව අරුතක් ලබාදීම.
- "පුංචි රෝමය" වශයෙන් හැඳින්වුණු සිල්ලාලේ යන බැතිමත් කතෝලික ග්‍රාමය කේන්ද්‍රස්ථානය කරගත් ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමා එතැනින් අන් ග්‍රාමවලට ද යමින් අවුරුදු දෙකහමාරක් පමණ උතුරේ සේවය කිරීම.
- හරබර දේශනාවන් මගින් ලංකාවේ විවිධ ප්‍රදේශවලට ගොස් කිතුනුවන් දහමින් පෝෂණය කිරීම.

**(දයා සේවාවන් පහක් සඳහන් කිරීමට ලකුණු 05ක්ද ඒවා කෙටියෙන් විස්තර කර ඇත්නම් තවත් ලකුණු 05ක් ද වශයෙන් ලකුණු 10 ලබා දෙන්න)**

**(ii). බ්‍රිතාන්‍ය යුගයේ දී මෙරටට පැමිණි සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකායේ ධර්මදූතවරුන්ගේ සේවය පිළිබඳව කරුණු පහක් දක්වමින් විස්තර කරන්න**

- ක්‍රි.ව. 1845 දී ජෝශප් බ්‍රාවි පියතුමා මෙරටට පැමිණීමත් සමඟම සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකායේ ධර්මදූතවරුන්ගේ සේවය ආරම්භ විය.
- ක්‍රි.ව. 1857 දී එතුමා දකුණු විකාරි වසමේ (කොළඹ) පාලක ධුරයට පත් වූ අතර එම ප්‍රදේශයේ සේවය සඳහා තවත් බෙනදිකාන පියවරු මෙහි පැමිණියහ.
- ක්‍රි.ව. 1863-1878 කාලය තුළ විකාරි වසම පාලනය කළේ හිලේරියන් සිල්ලානි නම් වූ බෙනදිකාන රදගුරුතුමාය. එතුමාගේ පාලන සමය දකුණු විකාරි වසමේ දියුණුව සඳහා විශාල සේවාවක් ඉටු වූ සමයක් විය.
- ශාන්ත ලුසියා ආසන දෙව්මැදුර ඉදි කිරීම ආරම්භ කිරීම.
- ශාන්ත බෙනඩික් විද්‍යාලය ඇතුළු පාසල් රැසක් ඇති කිරීම.
- යහපත් එඩේරා සොහොයුරියන් මෙරට සේවයට ගෙන්වීම.
- කොළඹ දිස්ත්‍රික්කයේ මෝදර, ග්‍රෑන්ඩ්පාස් වැනි ප්‍රදේශවල විශාල දෙව්මැදුරු ඉදි කිරීම.
- කතෝලික පුවත් පත් වන " Ceylon Catholic Messenger" 1869 දී හා "ඥානාර්ථ ප්‍රදීපය" 1873 දී ආරම්භ කිරීම.
- මහනුවර ප්‍රදේශයේ තැන් කිහිපයක සේවයට බෙනදිකාන පියවරු යැවීම.

- 1878 හිලේරියන් සිල්ලානි රදගුරුතුමාගේ ස්වර්ගස්ථ වීමෙන් පසු එම ධූරයට පත් කරන ලද්දේ ක්ලෙමන්ට් පඤ්ඤානි රදගුරුතුමාය.
- එතුමා වසර හතරක් පමණ කොළඹ ප්‍රදේශයේ ශාසන පාලක ලෙස කටයුතු කළ අතර එම කාලයේ බෙනදික්තාන පියවරුන්ගේ පැමිණීම හිඟ වූ නිසා කොළඹ ප්‍රදේශයේ සේවය නිමාකර එය නි.ම.නි. පියවරුන්ට බාරදීමට සිදුවිය.
- මහනුවර රදගුරු වසම ආරම්භයේ සිටම පාලනය කිරීමටත් එම රදගුරු වසමේ සේවයට බෙනදික්තාන පියවරු යැවීම.
(මෙවැනි කරුණු 5 ක් ඉදිරිපත් කොට කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු 10 දෙන්න)

**අභිමතාර්ථ:** ගරු ක්‍රිස්ටෝපර් බොන්ජීන් පියතුමා ලාංකීක අධ්‍යාපන ක්ෂේත්‍රයට කළ සේවය අගයමින් ශ්‍රී ලාංකීක ධර්මධානීය දූත මෙහෙවර දායකත්වය දැක්වීමට මඟ පෙන්වීම

8.

**(i). ගරු ක්‍රිස්ටෝපර් බොන්ජීන් පියතුමාගේ ජීවිත කථාව කෙටියෙන් සඳහන් කර, එතුමා විසින් ආධාර ලබන පාසල් (උපකෘත පාසල්) ක්‍රමය පිළිබඳ ඉදිරිපත් කළ යෝජනා පහක් සඳහන් කරන්න**

➢ **ගරු ක්‍රිස්ටෝපර් බොන්ජීන් පියතුමා**

- 1823 සැප්තැම්බර් 23 දා මෙතුමා උපත ලැබීය.
- 1847දී පැරිස් ධර්මදූත නිකායේ සභිකයෙකු ලෙස ඉන්දියාවට ගොස් එහි වසර නවයක් සේවය කළේය.
- 1856 දී ලංකාවට පැමිණ යාපනයේ දී (නි.ම.නි) ඔබ්ලේට් නිකායට බැදී උතුරේ සේවය කළේය.
- එතුමා "ලක් කතෝලික සසුනේ කටහඩ" නමින් හැඳින්විය.
- එතුමා ප්‍රධාන වශයෙන් සටන් කළේ අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙනි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙරට උපකෘත පාසල් ක්‍රමය බිහිවිය.
- උපකෘත පාසල් ක්‍රමයේ පීතෘවරයා ලෙස එතුමාව හඳුන්වන ලදී
- යාපනයේ රදගුරු තනතුරට පත් වූ එතුමා පසුව මෙරට ප්‍රථම අගරදගුරු ලෙස පත්විය.
- දේශීය පූජකයින් පුහුණු කිරීම සඳහා ලංකාවේ ප්‍රථම දේව ශාස්ත්‍රාලය වූ ශාන්ත මාර්ටින් දෙව්සත්හල 1869 දී ආරම්භ කරන ලදී.
- 1883 දී සාන්ත බර්නාඩ් දෙව්සත්හල විවෘත කිරීම.
- කොළඹ ශාන්ත ජෝශප් විද්‍යාලය හා වෙනත් විද්‍යාල විවෘත කිරීමට දායක විය.
- කොළඹ මහ රෝහලේ සේවය සඳහා කතෝලික පැවිදිවරියන් යොමු කිරීම.
- 1870 දී ජූලි මඩු මංගල්‍යය ආරම්භ කිරීම.
- වසර 69 ක් වූ ජීවිත කාලයෙන් වසර 36 ක් ලක්දිවට සේවය කරන ලදී.

➢ **උපකෘත පාසල් ක්‍රමය වෙනුවෙන් යෝජනා**

- ස්වභාෂා අධ්‍යාපනය පිළිබඳව රජයට යෝජනා ඉදිරිපත් කිරීම.
- ඉංග්‍රීසි භාෂාව මෙන්ම ජාතික භාෂාව ද පාසල් අධ්‍යාපනයට එකතු කළ යුතු යැයි රජයට අවධාරණය කිරීම.
- අධ්‍යාපනය සඳහා මව්බස යොදා ගැනීමේ අත්‍යාවශ්‍යතාවය පෙන්වාදීම, ගෙදරදී මෙන්ම පාසලේ දී ද දරුවාගේ අධ්‍යාපනයට ආගම සම්බන්ධ කළ යුතු බවට යෝජනා ඉදිරිපත් කිරීම.

- සෑම ආගමකටම පාසල් පවත්වා ගැනීමට ඉඩ තිබිය යුතු බව හා රජය එවැනි පාසල්වලට මුදලින් ආධාර දියයුතු බවට යෝජනාව රජයට ඉදිරිපත් කිරීම.
- ගරු ක්‍රිස්ටෝපර් බොන්ජින් පියතුමාගේ යෝජනා රජයේ අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද අතර ආධාර ලබන පාසල් ක්‍රමය හෙවත් උපකෘත පාසල් ක්‍රමය ආරම්භ වීම.

**( ගරු ක්‍රිස්ටෝපර් බොන්ජින් පියතුමාගේ ජීවිත කථාව කෙටියෙන් සඳහන් කර ඇත්නම් ද කරුණු පහකට ලකුණු 5 ද, උපකෘත පාසල් ක්‍රමය පිළිබඳ ඉදිරිපත් කර ඇති යෝජනා සඳහා ලකුණු 5 ද වශයෙන් ලකුණු 10 දෙන්න)**

**(ii). වත්මන් ලාංකික කිතුනු සභාව මඟින් සිදුවන දූත සේවාව අගයමින් කිතුනු සිසුවකු ලෙස ඒ සඳහා ඔබේ දායකත්වය කරුණු පහකින් විස්තර කරන්න**

- මීසමේ පූජකතුමාගේ කාර්යයන් වලට සහයෝගය දැක්වීම හා එතුමන් විසින් පවරන ලද කාර්යයන් ඉටුකිරීම.
- පවුල, පාසල සහ මීසම යන සමාජයන් තුළ අපට පැමිණෙන අභියෝග හා දුෂ්කරතා ජය ගනිමින් ඒවාට නොබියව මුහුණ දෙමින් ආගමික වාතාවරණයක් තුළ ජීවිතය හැඩ ගස්වා ගැනීම.
- පවුල තුළ යාච්ඤා කරමින්, මීසමේ සමිති සමාගම්වලට දායකත්වය දෙමින්, සමිති සමාගම් වලින් ගමට සේවය කිරීමට ඇප කැපවීම හා කාලය, ශ්‍රමය කිතුනු සභාව ගොඩ නැගීමට වැය කිරීම.
- දේශපාලනික, සමාජීය, ආර්ථික හා ආගමික වාතාවරණය තුළ අභියෝග, ගැටලු හා ගැරහුම්වලට මුහුණ දෙමින් වඩාත් ශක්තිමත් වී පවතින සමාජ යථාර්ථය හමුවේ නොසැලී, නොබියව ක්‍රිස්තුන් වහන්සේගේ සුභාරංචියට සාක්ෂි දරමින් තම ජීවිතයෙන් ක්‍රිස්තුන් වහන්සේව පිළිබිඹු කිරීම.
- රටට සේවය කරමින් යහපත් ගති පැවතුම්වලින් පූර්ණවත්ම තම දක්ෂතා කිතුනු සමාජයේ වර්ධනය හා උන්නතිය උදෙසා යෙදවීම.
- කිතුනු සභාව වෙනුවෙන් උරදුන්, ඇප කැපවුණු විවිධ පරිත්‍යාග සිදුකළ පුරෝගාමීන් අතර සිටි කිතුනුවන්ගේ මඟ පෙන්වීම අනුව යමින් අපගේ ජීවිත කැපවීම හා සභාවේ දියුණුව වෙනුවෙන් දයා සේවාවන්හි නිරත වීම.
- ජාති, ආගම්, කුල භේදයෙන් තොරව අන්‍යාගමික සහෝදර සහෝදරියන් සමඟ සහජීවනයෙන් හා අන්‍යෝන්‍ය ප්‍රේමයෙන් කටයුතු කරමින් කිතු සමිඳුන්ගේ සුභාරංචියට සාක්ෂි දැරීම.
- විවිධ සමිති සමාගම් සඳහන් කර ඔවුන් විසින් කරන ලද කාර්යයන් ලියා ඇත්නම් ඒවාටද ලකුණු දෙන්න.

  උදා: දහම් පාසල තුළ දහම් සේවය

  ධර්මදූත ළමා සමාජය මගින් කරන සේවය

  (කරුණු දෙකක් ලෙස සලකන්න)

**(මෙවැනි කරුණු පහකට ලකුණු 2 x 5 = 10 ලබා දෙන්න)**